# දේශපාලන නාදය

රට කරවූ ශ්‍රේෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයෝ රැසකගේ දේශපාලන නිජබිම වූයේද ඓතිහාසික කෑගලු පුරයයි. රට එක්සේසත් කළ මහා පරාක්‍රමබාහු රජුගේ ජන්ම භූමිය වූයේද ,පළමුවන විජයබා ,වළගම්බා ආදී ශ්‍රේෂ්ඨ නරපතීන්ට රට පාලනය කිරීම උදෙසා ප්‍රබල දායකත්වයක් දැක්වූ ප්‍රදේශයක් ලෙස කෑගල්ල ඉතිහාසගත වී ඇත. 1948 පසු යුගයේ දේශපාලන කරලියෙහි නම රැන්දූ අසාහය දේශපාලඥයෝ රැසක් කෑගලු පුර ස්වකීය දේශපාලන නිජබිම කර ගත්හ. ඩඩ්ලි සේනානායක ,ඇන්.ඇම්.පෙරේරා ,ෆැන්සිස් මොලමුරේ ,පී.බී.බාලසූරිය ,ජී.බී.පී.කලුගල්ල ,අශෝක කරුණාරත්න ආදීහු දේශපාලන ක්ෂේත්‍රයේ කෑගලු පුර නියෝජනයේ පුරෝගාමීහු වූහ.




